අධ්‍යාපන අමාත්‍යාංශය
கல்வி அமைச்சு
Ministry of Education

'ඉසුරුපාය', බත්තරමුල්ල, ශ්‍රී ලංකාව.
'இசுருபாய', பத்தரமுல்ல, இலங்கை.
'Isurupaya', Battaramulla, Sri Lanka.
+94112785141-50 +94112784846
isurupaya@moe.gov.lk www.moe.gov.lk

මගේ යොමුව / எனது இல. / My Ref. ED/01/10/01/28/152 – II

ඔබේ යොමුව / உமது இல. / Your Ref.

දිනය / திகதி / Date 2018.08. 31

චක්‍රලේඛ අංක : 48/2017(I)

පළාත් අධ්‍යාපන ලේකම්වරුන්,
පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂවරුන්,
කලාප අධ්‍යාපන අධ්‍යක්ෂවරුන්,
ආධාර ලබන රජයේ අනුමත පෞද්ගලික පාසල් කළමනාකරුවන්,
ආධාර ලබන රජයේ අනුමත පෞද්ගලික පාසල් විදුහල්පතිවරුන්.

ආධාර ලබන රජයේ අනුමත පෞද්ගලික පාසල් වල අනුමත පත්වීම්ධාරී ගුරුවරුන් සඳහා 2017 අයවැය තුලින් යෝජිත දේපළ ණය පිළිබඳ වරප්‍රසාද ලබාදීම.

ආධාර ලබන රජයේ අනුමත පෞද්ගලික පාසල් වල අනුමත පත්වීම්ධාරී ගුරුවරුන් සඳහා 2017 අයවැය තුලින් යෝජිත දේපළ ණය පිළිබඳ වරප්‍රසාද ලබාදීම පිළිබඳව මීට පෙර නිකුත් කර ඇති 2017.12.29 දිනැති අංක 48/2017 චක්‍රලේඛයට අමතර වශයෙන් මෙම චක්‍රලේඛයේ සංශෝධනයන් මින් ඉදිරියට බලපැවැත්වේ.

02. ජාතික අයවැය දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් 2018.07.03 දින ලබා දී ඇති උපදෙස් ප්‍රකාරව 48/2017 චක්‍රලේඛයේ 6.1 හා 11.7 වගන්ති පහත පරිදි සංශෝධනය කරමි.

6.1 ඉහත 5.1 වගන්තිය යටතේ ලබා ගන්නා ණය මුදල් වෙනුවෙන් පහත වගුවේ සඳහන් පරිදි වාර්ෂික පොළියක් අය කරනු ලැබේ.

ණය මුදල	ගුරුභවතා විසින් ගෙවිය යුතු පොළී ප්‍රතිශතය	රජය විසින් ගෙවිය යුතු පොළී ප්‍රතිශතය	බැංකුවට ගෙවිය යුතු පොළී ප්‍රතිශතය
රු. 500,000/- දක්වා	4%	7%	11%
රු. 500,001/- සිට රු.1,000,000/- දක්වා	7%	4%	11%
රු.1,000,001/- සිට රු.3,000,000/- දක්වා	9%	3%	12%

ගරු අමාත්‍යතුමා / கௌரவ அமைச்சர் / Hon. Minister
+94112784832
+94112784825
education@moe.gov.lk

ලේකම් / செயலாளர் / Secretary
+94112784811
+94112785162
secretary.education@moe.gov.lk

11.7 ණය ලබා ගැනීමට සුදුසුකම් ලත් ගුරුභවතෙකු වෙනුවෙන් කලාප අධ්‍යාපන කාර්යාලයෙන් බැංකුව වෙත ලබා දෙන නිර්දේශය ප්‍රමාද වන්නේ නම් හෝ බැංකුවකින් ණය ලබා ගැනීමට අනවශ්‍ය ප්‍රමාදයක් සිදුවන්නේ නම්, ඒ බව ලිඛිතව අධ්‍යාපන අමාත්‍යාංශයේ ලේකම් වෙත දැන්විය යුතුය.

03. මෙම චක්‍රලේඛයෙන් සංශෝධනය වන කරුණු හැර සෙසු සියළු උපදෙස් චක්‍රලේඛ අංක 48/2017 ට අනුකූල විය යුතුය.

සුනිල් හෙට්ටිආරච්චි
ලේකම්
අධ්‍යාපන අමාත්‍යාංශය

පිටපත්:

1. ලේකම් - රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ අමාත්‍යාංශය
2. ලේකම් - මුදල් අමාත්‍යාංශය
3. ලේකම් - රාජ්‍ය ව්‍යාවසාය සංවර්ධන අමාත්‍යාංශය
4. අධ්‍යක්ෂ ජනරාල් - ජාතික අයවැය දෙපාර්තමේන්තුව